

මුදල් කොමිෂන් සභාවේ

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

වැය ශීර්ෂ අංකය 011

මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත, රාජගිරිය

පටුන

පිටුව

පරිච්ඡේදය - 01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය 1

පරිච්ඡේදය - 02: ප්‍රගතිය සහ අනාගත දැක්ම 8

පරිච්ඡේදය - 03: 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 18

පරිච්ඡේදය - 04: කාර්යසාධන දර්ශක 30

පරිච්ඡේදය - 05: තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 31

පරිච්ඡේදය - 06: මානව සම්පත් පැතිකඩ 33

පරිච්ඡේදය - 07: අනුකූලතා වාර්තාව 35

පරිච්ඡේදය - 01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය

1.1. හැඳින්වීම

පසුබිම

වර්ෂ 1987 දී සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ප්‍රකාරව පළාත් සභා ස්ථාපිත කිරීමත් සමග පළාත් සභාවන්හි කාර්යභාරය ක්‍රියාත්මක කිරීම පහසු කරලීම පිණිස මුදල් කොමිෂන් සභාව ද ස්ථාපනය කරන ලදී. පළාත් සභා ස්ථාපිත කිරීමට අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) - 154 (ච) ව්‍යවස්ථාවන් අනුව, පළාත් සභාවන්හි නිසි ක්‍රියාකාරිත්වය උදෙසා පුළුල් පාලන රාමුවක් නිර්මාණය කිරීම පිණිස, 1987 අංක 42 දරන පළාත් සභා පනත සම්මත කර ගන්නා ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ ලැයිස්තුව **I** හි සඳහන් පළාත් සභා වෙත බලය බෙදා හැරුණු විෂයයන් සම්බන්ධයෙන් මෙන්ම, එම උපලේඛනයේ ලැයිස්තුව **III** හි (සමගාමී ලැයිස්තුවේ) සඳහන් හවුල් වගකීම් පිළිබඳ විෂයයන් සම්බන්ධයෙන් ද සේවා සැපයීමේ වගකීම පළාත් සභා සතු වේ. වර්තමානයේදී පළාත් සභා සතු ආදායම ඉතා අල්ප බැවින්, පළාත් සභාවල සේවා සැපයීම සඳහා අවශ්‍ය සම්පත්වලින් විශාල කොටසක් සපයා ගනු ලබන්නේ, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත ජාතික අයවැයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන මගිනි.

මුදල් කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ජ ව්‍යවස්ථාවෙහි මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේ ප්‍රතිපාදන සඳහන් වන අතර, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ද එහි පැහැදිලි කර ඇත. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ජ' (3), (4) හා (5) යන ව්‍යවස්ථාවල සඳහන් පරිදි මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත දැක්වේ.

> **154 ජ (3) ව්‍යවස්ථාව:** පළාත් අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය.
>
> **154 ජ (4) ව්‍යවස්ථාව:** පහත දැක්වෙන කරුණුවලට අදාලව ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ වගකීම වේ.
>
> (අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති; සහ
>
> (ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක්,

154 ඡ (5) ව්‍යවස්ථාව: රට තුළ ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කරගැනීම අරමුණු කර කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙළ කළ යුතු අතර ඒ අනුව,

(අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;

(ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;

(ඇ) විවිධ පළාත් අතර ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය; සහ

(ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර වැඩිම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව, සැලකිල්ලට ගත යුත්තේය.

ගරු ජනාධිපතිතුමා වෙත මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සහිත වාර්තාව ලැබීමෙන් අනතුරුව, එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම උදෙසා කැබිනට් මණ්ඩලයට වෙත ඉදිරිපත් කරනු ලැබේ. අනතුරුව 154 'ඡ' (7) ව්‍යවස්ථාවට අනුව ගරු ජනාධිපතිතුමා විසින් එකී නිර්දේශ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මුදල් කොමිෂන් සභාව පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

i. සුමිත් අබේසිංහ මහතා - සභාපති
ii. ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා - නිල බලයෙන් සාමාජික සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති
iii. කේ. එම්. මහින්ද සිරිවර්ධන මහතා - නිල බලයෙන් සාමාජික සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
iv. සින්නතම්බි සමිතම්බි මහතා - සාමාජික
v. ජනාධිපති නිතීඥ රාසික් සරුක් මහතා - සාමාජික

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

මුදල් කොමිෂන් සභාව සිය උපායමාර්ගික සැලැස්ම සකස් කර 2021 සිට 2024 දක්වා කාල සීමාව සඳහා යාවත්කාලීන කර ඇති අතර එම උපායමාර්ගික සැලැස්ම තුළ දැක්ම, මෙහෙවර, ප්‍රමුඛ පරාස සහ අරමුණු පැහැදිලිව හඳුනාගෙන ඇත.

දැක්ම

තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සහිත සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්

මෙහෙවර

රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම හා පළාත් සභාවන්ට අරමුදල් බෙදාවෙන් කිරීම පිළිබඳ මූලධර්ම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

මුදල් කොමිෂන් සභාවේ අරමුණු

1. පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා දීම සඳහා නිර්දේශ කිරීම.
2. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අරමුණු කර ගනිමින් පළාත් අතර මූල්‍ය සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කිරීම.
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය සපුරාලීම.

1.3. ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල ප්‍රකාරව, මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එවැනි අරමුදල් පළාත් අතර බෙදා දෙන ආකාරය පිළිබඳ ප්‍රතිපත්තිමය නිර්දේශ ජනාධිපතිවරයාට ඉදිරිපත් කිරීමයි.

මෙම ක්‍රියාවලියේදී මුදල් කොමිෂන් සභාව;

I. පළාත් සභාවන් සඳහා අවශ්‍ය වන වාර්ෂික අරමුදල් අවශ්‍යතා ඇස්තමේන්තු කර ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ සැපයීම,
II. පළාත් සභා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා අර්ථාන්විත පදනමක් මත තක්සේරු කිරීම හා විශ්ලේෂණය කිරීම,
III. ජාතික අයවැයෙන් පළාත් සභාවලට ලබාදිය යුතු ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදාන පිළිබඳව සහ එම අරමුදල් පළාත් අතර බෙදා හැරීම පිළිබඳව රජයට නිර්දේශ ලබා දීම,
IV. ජාතික අයවැයෙන් වෙන් කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදනයන්ට අදාලව වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ ලබා දීම,
V. කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සම්පත් භාවිතය උදෙසා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී පළාත් සභාවලට සහාය වීම සිදු කරනු ලබයි.

1.4. මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ

1.4.1. ව්‍යවස්ථාපිත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව යටතේ පහත සඳහන් ක්‍රියාකාරී සහ උපකාරක අංශ ක්‍රියාත්මක වේ.

- පළාත් සංවර්ධන සැලසුම් අංශය
- පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය
- ප්‍රතිපත්ති අධ්‍යයන හා වාර්තා කිරීමේ අංශය
- පළාත් ආදායම් අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

1.4.2. මුදල් කොමිෂන් සභාවේ එක් එක් අංශයන්හි විශේෂිත කාර්යයන්

මුදල් කොමිෂන් සභාවේ එක් එක් අංශය මගින් සිදු කරනු ලබන විශේෂිත කාර්යයන් පහත දැක්වේ.

අ. පළාත් සංවර්ධන සැලසුම් අංශය

1. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවලට ඇතුළත් කිරීම සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම
2. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම
3. පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දීම

ආ. පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය

1. පළාත් අතර අරමුදල් වෙන් කිරීම සඳහා වෙන් වෙන්ව පළාත් සභා, පළාත් පාලන ආයතන හා අනෙකුත් පළාත් ආයතනවල පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම.
2. පළාත්වලට අවශ්‍ය පරිපූරක ප්‍රතිපාදන ඉල්ලීම් විශ්ලේෂණය කිරීම හා නිර්දේශ කිරීම.
3. පළාත් සේවක සංඛ්‍යාව තීරණය කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැටුප් කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය වීම.

ඇ. ප්‍රතිපත්ති අධ්‍යයන හා වාර්තා කිරීමේ අංශය

1. අධ්‍යන සිදු කිරීම හරහා රජයේ අරමුදල් වෙන් කිරීම හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීම සඳහා අවශ්‍ය මූලධර්ම හඳුනා ගැනීම
2. ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සකස් කිරීමේදී මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට සහාය වීම
3. පාර්ලිමේන්තුව වෙත යැවීම සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කිරීම හා අනෙකුත් වාර්තා සකස් කිරීම.

ඈ. පළාත් ආදායම් අංශය

1. පළාත් ආදායම් තක්සේරු කිරීම සහ ආදායම් ඉලක්ක සැකසීම
2. පළාත් පාලන ආයතනයන් හි ආදායම් අධ්‍යනය කිරීම
3. පළාත් ආදායම් පිළිබඳ තොරතුරු පාර්ශවකරුවන්ට ඉදිරිපත් කිරීම

ඉ. පාලන අංශය

1. මුදල් කොමිෂන් සභාවේ ආයතනික පරිපාලනමය කටයුතු ක්‍රියාත්මක කිරීම
2. නිවාඩු, රක්ෂණය, අතිකාල සහ වෙනත් ගෙවීම්, ප්‍රවාහනය, පුද්ගලික ලිපිගොනු පිළිබඳ කාර්යයන් සහ වත්කම් නඩත්තු කිරීම
3. පුහුණුව හා මානව සම්පත් සංවර්ධනය

ඊ. ගිණුම් අංශය

1. මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීම සහ සකස් කිරීම
2. මූල්‍ය පාලනය සහ තොරතුරු නඩත්තු කිරීම
3. ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම (භාණ්ඩ, භෞතික ක්‍රියාකාරකම් සහ සේවා)

උ. අභ්‍යන්තර විගණන අංශය

1. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම
2. මුදල් කොමිෂන් සභාවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සහ එවැනි පාලන පද්ධතිවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම.
3. ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, චක්‍රලේඛ සහ රෙගුලාසි ආදිය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අනුකූලතාවය තක්සේරු කිරීම සහ නිවැරදි කිරීම් සහ වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.5. සංවිධාන සටහන



නි.අ /ස.අ -නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
ප.නි - පරිපාලන නිලධාරී
තො.කා.ස.නි - තොරතුරු තාක්ෂණ හා සංනිවේදන නිළධාරී
ස. නි - සංඛ්‍යාන නිළධාරී

ස.ප.නි - සහකාර පර්යේෂණ නිළධාරී
සං. නි - සංවර්ධන නිළධාරී
කා.සේ.නි - කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස - කාර්යාල කාර්යය සහයක

1.6. මුදල් කොමිෂන් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

මුදල් කොමිෂන් සභාව යටතේ කිසිදු ආයතනයක්/අරමුදලක් පිහිටුවා නැත.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) – මුදල් කොමිෂන් සභාව යටතේ එවැනි ව්‍යාපෘති නොමැත.

අ) ව්‍යාපෘතියේ නම
ආ) දායක නියෝජිතායතනය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.
ඈ) ව්‍යාපෘති කාල සීමාව

} අදාල නොවේ

පරිච්ඡේදය - 02: ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 ප්‍රගතිය

මුදල් කොමිෂන් සභාව, සිය ව්‍යවස්ථාපිත කාර්යයන්වලට සහ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් 2022 වර්ෂය තුළ සාර්ථකව සිදු කරන ලදී

2.1.1 කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීම හා අදාල කරුණු

2022 වර්ෂය තුළ කොමිෂන් සභා රැස්වීම් පැවති දින සහ එහිදී සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු / ගන්නා ලද තීරණ පහතින් දක්වා ඇත.

දිනය	සාකච්ඡා කළ කරුණු	ගනු ලැබූ තීරණ සහ විශේෂිත කරුණු
2022.01.28	වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ - 2023	කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ සඳහා අනුමැතිය ලබා දෙන ලදී
	වාර්ෂික පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ - 2023	කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ සඳහා අනුමැතිය ලබා දෙන ලදී
	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත් සභාවල අතැති බිල්පත් - 2021	අතිරේක ප්‍රතිපාදන ලබා දීමට සලකා බැලීම සඳහා එම තොරතුරු මහා භාණ්ඩාගාරය වෙත යැවීමට කොමිසම තීරණය කරන ලදි. එමෙන්ම ලැබෙන අක්මුදල්වලින් අතැති බිල්පත් පියවීමට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස පළාත් සභා දැනුවත් කිරීමට ද තීරණය කරන ලදි.
2022.06.09	එකඟතාව ලබා දීම සඳහා පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් - 2022 සමාලෝචනය කිරීම හා ඊට අදාල තොරතුරු	වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳව පළාත් සභාවල කාර්යභාරය හා ඒවා සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය කොමිෂන් සභාවේ ඇගයීමට ලක් විය.
	2022 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම.	2022 වර්ෂයේ කොමිෂන් සභාව රැස්වූ දිනය තෙක් පැවති, පළාත් සභා සඳහා නිර්දේශිත අතිරේක ප්‍රතිපාදන අනුමත කරන ලදී.
	පළාත් සභා සඳහා නිර්දේශිත මූල්‍ය ප්‍රතිපාදන - 2022 සංශෝධනය	2022 වසර සඳහා වූ ජාතික අයවැය සංශෝධනය කිරීමේදී, 2022 වසර සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන සහ සාමූහික ප්‍රදාන යටතේ ජාතික අයවැයෙන් පළාත් සභා සඳහා ලබා දී ඇති සීමිත ප්‍රතිපාදන අඩු කිරීමෙන් වළකින ලෙස මහා භාණ්ඩාගාරයට කරන ලද නිර්දේශයට කොමිෂන් සභාව එකඟ විය.
	පළාත් සභාවල අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය	පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තර වාර්තාවක් මුදල් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

2022.08. 04	2023 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන සහ ප්‍රාග්ධන අවශ්‍යතා නිර්දේශ කිරීම	ඇතැම් පළාත් සභා විසින් කරන ලද ඉල්ලීම මත නඩත්තු වියදම් සම්බන්ධයෙන් සුළු සංශෝධන කිහිපයක් සමග මෙම නිර්දේශිත ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව එකඟ විය.
	ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් පිළිබඳ තොරතුරු	මෙම තොරතුරු කොමිෂන් සභාවේ අවධානය සඳහා ඉදිරිපත් කරන ලදි.
2022.11.15	2023 වසර සඳහා පළාත් සභාවලට අරමුදල් ලබාදීම	එක් එක් පළාත් සභා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.
	2022 වර්ෂය වෙනුවෙන් පළාත් පුනරාවර්තන අවශ්‍යතා සඳහා අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම	අතිරේක ප්‍රතිපාදන සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.
2022.12.19	මාර්ගෝපදේශ • වාර්ෂික සංවර්ධන සැලැස්ම - 2023 සකස් කිරීම සඳහා • නඩත්තු සැලැස්ම - 2023 සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා • පාසල් පෝෂණ වැඩසටහන - 2023 සඳහා	අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම මාර්ගෝපදේශ ප්‍රධාන ලේකම්වරුන් වෙත යැවීමට කොමිසම තීරණය කරන ලදි.

2.1.2 පළාත් ප්‍රාග්ධන අයවැයට අදාල කටයුතු

i. පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීමට අදාල මාර්ගෝපදේශ නිකුත් කිරීම

ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව සිය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන්ට යටත්ව, වාර්ෂිකව පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා තක්සේරු කරනු ලබයි. ඒ අනුව, 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම පිණිස, අදාල මාර්ගෝපදේශ සකස් කර 2022 ජනවාරි 28 වන දින පළාත් සභා වෙත යවන ලදී.

ii පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම - 2022

මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සකසන ලද 2022 වසර සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම් (ADPs), සියලු පළාත් සභා විසින් මුදල් කොමිෂන් සභාවේ එකඟතාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. එම වාර්ෂික සංවර්ධන සැලසුම් කොමිෂන් සභාව විසින් අධ්‍යයනය කරන ලද අතර, ඒ සඳහා සියලු පළාත් සභා සමග සමාලෝචන රැස්වීම් සූම් (zoom) තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. මුදල් කොමිෂන් සභාවේ සභාපති, කොමිෂන් සභාවේ ඇතැම් සාමාජිකයින්, කොමිෂන් සභාවේ ලේකම් ඇතුළු මුදල් කොමිෂන් සභාවේ අනෙකුත් අදාල නිලධාරීන්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාල වගකිවයුතු නිලධාරීන් සහ උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා ද එම සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වූහ. ඒ අනුව, පළාත් නිලධාරීන් සමඟ එකඟ වූ

සංශෝධනයන්ට යටත්ව 2022 වාර්ෂික සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාස දක්වා ප්‍රතිපත්තිමය එකනගතාවය ලබා දෙන ලද අතර ඒ පිළිබඳව පළාත් සභා වෙත ලිඛිතව දැනුම් දෙන ලදි.

පවත්වන ලද වාර්ෂික සමාලෝචන රැස්වීම්වල කාලසටහන පහත දැක්වේ.

රැස්වීම පැවැත්වූ දිනයන්	පළාත
2022.03.04	මධ්‍යම
2022.03.07	දකුණු
2022.03.07	බස්නාහිර
2022.03.08	නැගෙනහිර
2022.03.09	ඌව
2022.03.14	උතුරු
2022.03.15	සබරගමුව
2022.03.16	වයඹ
2022.03.21	උතුරු මැද

iii. 2023 වර්ෂය සඳහා පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම

ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවල ඉදිරි වසරේ ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම මූලිකව සිදු කළ යුක්තකි. එබැවින්, මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව ඉදිරිපත් කර තිබූ මූල්‍ය අවශ්‍යතා සමාලෝචනය කරනු ලැබූ අතර, සිදුවිය හැකි ව්‍යාපෘති ද්විකරණය වීම් පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

iv. 2023 වර්ෂය සඳහා එක් එක් පළාත් සභා වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව දැනුම් දීම.

පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබා දුන් 2023 වර්ෂයේ විසර්ජන පනත් කෙටුම්පතට අනුව, 2023 වසර සඳහා ජාතික අයවැයෙන් වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව පළාත් සභා වෙත දැනුම් දෙන ලදී (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - රු. බිලියන 16.9, උපමාන පාදක ප්‍රදාන - රු. බිලියන 3 සහ විදේශ ආධාර ව්‍යාපෘති - රු. බිලියන 17.1).

v. වාර්ෂික සංවර්ධන සැලසුම් (ADP) සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ - 2023

2023 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් (ADPs) සකස් කිරීම පිණිස, අවශ්‍ය මාර්ගෝපදේශ සමග අදාල ආකෘති 2022 දෙසැම්බර් 21 වැනි දින පළාත් සභා නවය වෙත යවන ලදී. 2023 වසර සඳහා වෙන් කර ඇති අරමුදල් භාවිතය සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී මෙම මාර්ගෝපදේශ අනුගමනය කෙරේ. ජාතික ප්‍රතිපත්ති රාමුව සහ පළාත් සංවර්ධන ප්‍රමුඛතාවලට අනුව පළාත් සභා විසින් සකසන ලද මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම්වලට අනුකූලව, පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ.

vi. නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ - 2023

පළාත් සභාවල නඩත්තු කටයුතු සඳහා ජාතික අයවැයෙන් රුපියල් බිලියන 9ක වෙනම ප්‍රතිපාදනයක් ප්‍රථම වරට 2022 වර්ෂයේදී වෙන් කර දුන් අතර, ඒ අනුව නඩත්තු පිරිවැය සඳහා 2023 වසර සඳහා ද රු. බිලියන 15 ක් වෙන් කෙරිණි. 2023 වසර සඳහා නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස මුදල් කොමිෂන් සභාව විසින්

මාර්ගෝපදේශ සකස් කර පළාත් සභා වෙත යවන ලදී. වත්කම් නඩත්තු කිරීම පළාතේ සංවර්ධනය සමග සෘජුව සම්බන්ධ වන බැවින්, විශේෂයෙන්ම ප්‍රාග්ධන ප්‍රදානවල ඇති සීමාසහිත බව සැලකිල්ලට ගෙන මහජනතාවට සෘජුවම ප්‍රයෝජනවත් වන නඩත්තු කටයුතු සඳහා මෙම ප්‍රතිපාදන යෙදවීමට නියමිතය.

2.1.3 පළාත් පුනරාවර්තන අයවැයට අදාල කටයුතු

පළාත්වල පුනරාවර්තන අවශ්‍යතා මූලික වශයෙන් තක්සේරු කරනු ලබන්නේ පළාත් සභා මගින් කරනු ලබන ඉල්ලීම් මතය. පළාත් පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය මගින් 2022 වර්ෂයේ දී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

I. 2023 වර්ෂය සඳහා පුනරාවර්තන අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම.

පළාත් සභාවල පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමට අදාල මාර්ගෝපදේශ 2022 ජනවාරි 28 වැනි දින නිකුත් කිරීමත් සමග මෙම ක්‍රියාවලිය ආරම්භ විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අනුව මෙම මාර්ගෝපදේශ නිකුත් කර ඇත. මෙම මාර්ගෝපදේශ ප්‍රධාන වශයෙන් පුද්ගල පඩිනඩි, අනෙකුත් පුනරාවර්තන වියදම්, පළාත් පාලන ආයතනවලට මාරු කිරීම් සහ පළාත් ආදායම් ඇස්තමේන්තු යනාදී කරුණු මත පදනම් වේ. ඊට අමතරව, ප්‍රදාන සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කිරීමේදී පළාත් සභා විසින් සම්පූර්ණ කළ යුතු ආකෘති කට්ටලයක් ද යවන ලදී.

II. 2023 වසර සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම.

පළාත් සභා විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද තම අවශ්‍යතා ඇතුළත් ආකෘති පත්‍ර , මාර්ගෝපදේශ සමග අමුණා ඇති දින දර්ශනයට අනුව මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා පළාත් බලධාරීන් සමග සාකච්ඡා කර තක්සේරු කරන ලදී. මේ සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, අයවැය අධ්‍යක්ෂවරුන් ඇතුළු අනෙකුත් අදාල පළාත් නිලධාරීන් සමග රැස්වීම් කිහිපයක් පැවැත්විණි. ජාතික අයවැය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් ද රැස්වීම් සඳහා සහභාගී වූහ. (වසංගත තත්ත්වය හේතුවෙන් පළාත් සමග සියලු රැස්වීම් Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී).

පුනරාවර්තන අවශ්‍යතා සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වාර්ෂික අයවැය සාකච්ඡා කාලසටහන පහත දැක්වේ.

සාකච්ඡා පැවැත්වූ දිනයන්	පළාත
2022.06.16	බස්නාහිර
2022.06.17	දකුණු
2022.06.20	නැගෙනහිර
2022.06.21	මධ්‍යම
2022.06.22	ඌව
2022.06.23	සබරගමුව
2022.06.28	උතුර
2022.06.29	උතුරු මැද
2022.06.30	වයඹ

iii. පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳ නිර්දේශ මහා භාණ්ඩාගාරයට දැනුම් දීම

පළාත් බලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2023 ජාතික අයවැය සකස් කිරීම සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා මහා භාණ්ඩාගාරයට යැවීමට පෙර මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. පළාත් සභා සඳහා නිර්දේශිත රු.මි. 450,123 ක පුනරාවර්තන ප්‍රතිපාදන (ආදායම් මාරු කිරීම, හදිසි අරමුදල් සහ අත්තිකාරම් ''බී'' ගිණුම සඳහා ඉල්ලීම් ඇතුළුව), 2022.08.10 දින භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදී.

iv. වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණය පළාත්වලට දැනුම් දීම

2023 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පතේ අනුමැතියට අනුව, ජාතික අයවැය යටතේ පළාත් සභාවලට වෙන් කළ පුනරාවර්තන අයවැය ප්‍රමාණයන් 2022.11.22 දින පළාත් වෙත දැනුම් දෙන ලදී. 2023 ජාතික අයවැය යටතේ වෙන්කළ මුළු ප්‍රතිපාදනය රු.මි. 410,297 කි.

v. 2022 වසර සඳහා පරිපූරක ප්‍රතිපාදන නිර්දේශ කිරීම

අතිරේක ප්‍රතිපාදන සඳහා පළාත් සභා වෙතින් ඉල්ලීම් ඉදිරිපත් වන්නේ, ප්‍රධාන වශයෙන් අයවැය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයට නිර්දේශ කිරීමෙන් පසුව රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් සභාවලට සේවක මණ්ඩල අනුයුක්ත කිරීම සහ නව බඳවා ගැනීම් හේතුවෙන් වන අතර පළාත් සභාවල ඉල්ලීම් අනුව ඒවා මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කර යවන ලදී. එලෙස නිර්දේශ යැවූ ප්‍රමාණයන් පහත දැක්වේ.

(Rs. '000)

දිනය	පුරප්පාඩු පිරවීම සඳහා අතිරේක ප්‍රතිපාදන නිර්දේශය	රේඛීය අමාත්‍යාංශ අනුයුක්ත කිරීම් සඳහා අතිරේක ප්‍රතිපාදන නිර්දේශය	නව නිර්දේශ කිරීම්	මුළු නිර්දේශ කිරීම්
2022.03.19		51,319		51,319
2022.05.18		112,156	24,737,640	24,849,796
2022.11.14	340	661,927		662,267
2022.11.22			2,784,289	2,784,289
එකතුව	**340**	**825,402**	**27,521,929**	**28,347,671**

vi. 2023 වසර සඳහා පළාත් ආදායම තක්සේරු කිරීම

2023 වර්ෂය සඳහා වූ පුනරාවර්තන මාර්ගෝපදේශ සමග නිකුත් කරන ලද ''E'' ආකෘති පත්‍රය, පළාත් සභා විසින් සම්පූර්ණ කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. අනතුරුව, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා මගින් ඉදිරිපත් කරන ලද පළාත් ආදායම් ඉලක්ක විශ්ලේෂණය කළ අතර, 2023 වර්ෂය සඳහා වන ආදායම් ඉලක්ක තක්සේරු කරන ලදී. 2023 වර්ෂයට අදාල පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ අයවැය අධ්‍යක්ෂ ඇතුළු පළාත් නිලධාරීන් සමග පැවති රැස්වීම්වලදී පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද පළාත් ආදායම් ඉලක්ක ද සමාලෝචනය කර අවසන් තීරණයට එළඹිණි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කරන ලද එකඟ වූ පළාත් ආදායම් ඉලක්ක සහ රජයේ ආදායම් මාරු කිරීම් මත පදනම්ව 2023 වර්ෂය සඳහා පළාත් ආදායම් මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලදී.

ඉදිරි වසර සඳහා එක් එක් පළාත් සභාවට අදාල සාමූහික ප්‍රදාන ගණනය කරනු ලබන්නේ, පළාත් පුනරාවර්තන අවශ්‍යතාවයෙන් පළාත් ආදායම අඩු කිරීමෙනි.

2.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් ආකෘතියට අනුව සකසන ලද 2021 වර්ෂය සඳහා වන මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව, 2022 ජුනි 16 වන දින ජනාධිපති ලේකම් කාර්යාලය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාවට, ආයතනය පිළිබඳ සමස්ථ විග්‍රහයක්, එහි ප්‍රධාන කාර්යයන්වලට අදාළ සමස්ත කාර්යසාධනය , මූල්‍ය ප්‍රගතිය සහ අනුකූලතා වාර්තාව ඇතුළත් වේ.

2.1.5 ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශවලට අදාල කටයුතු

i. ගරු ජනාධිපතිතුමා වෙත යැවීම පිණිස 2023 වසර සඳහා කොමිසමේ වාර්ෂික නිර්දේශ සැකසීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ ව්‍යවස්ථාව ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව, පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැයෙන් අරමුදල් වෙන් කිරීම සහ රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් එම අරමුදල් පළාත් නවය අතර බෙදා හැරීම පිළිබඳව සිය නිර්දේශ ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව පුළුල් සාකච්ඡා කිහිපයකින් අනතුරුව, 2023 වර්ෂය සඳහා වන නිර්දේශ භාෂා තුනෙන්ම සකස් කර ගරු ජනාධිපතිතුමා වෙත 2022 ඔක්තෝබර් 07 වැනි දින ඉදිරිපත් කරන ලදී.

රජය මුහුණ දී ඇති පෙර නොවූ විරූ රාජ්‍ය මූල්‍ය අර්බුද පසුබිම තුළ, මුදල් කොමිෂන් සභාව ද පළාත් මට්ටමින් සම්පත් වෙන්කිරීමේ සහ භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වූ යම් යම් යෝජනා සිය නිර්දේශවලින් ඉදිරිපත් කර ඇත. මීට පෙර කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද අතිරේක වියදමකින් තොරව ක්‍රියාත්මක කළ හැකි නිර්දේශවලින් වැඩි ප්‍රමාණයක් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බව කොමිසම විසින් නිරීක්ෂණය කරන ලද බැවින්, මීට පෙර කරන ලද වැදගත් නිර්දේශ කිහිපයක් කෙරෙහි ද එම වාර්තාවෙන් නැවත අවධාරණය කර ඇත. එසේම, 2023 වසර සඳහා ජාතික අයවැයෙන් පළාත් සභාවලට අවශ්‍ය ප්‍රාග්ධන හා පුනරාවර්තන අරමුදල් නිර්දේශ කිරීම සහ එම අරමුදල් වඩාත් අර්ථාන්විත පරිදි පළාත් සභා නවය අතර බෙදා හැරීම ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද 2023 වසරේ මුදල් කොමිෂන් සභා නිර්දේශ වාර්තාවෙ හි දක්වා ඇති යෝජනා සාරාංශ ගත කොට පහත දක්වා ඇත.

01 වන යෝජනාව

පළමු යෝජනාව වන්නේ පවතින සීමිත සම්පත් ප්‍රමාණය තුළින්ම ප්‍රමාණවත් ලෙස පළාත් සභාවලට සම්පත් වෙන්කර දීම සම්බන්ධයෙනි. විමධ්‍යගත විෂයයන් සඳහා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනයේ ලැයිස්තුව I හි දක්වා ඇති) රේඛීය අමාත්‍යාංශවලට ප්‍රතිපාදන ලබා දීමෙන් වළකින ලෙසත්, එම සම්පත් පළාත් සභාවලට වෙන් කරන ලෙසත් මුදල් කොමිෂන් සභාව බලධාරීන්ගෙන් ඉල්ලා ඇත. බොහෝ අවස්ථාවලදී රේඛීය අමාත්‍යාංශවලට වෙන් වන ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලබන එවැනි ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා තමන්ගේම යාන්ත්‍රණයක් නොමැති බැවින් විමධ්‍යගත විෂයයන් සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත මුදල් වෙන්කිරීම නුසුදුසු බවත් සහ පළාත් සභා සතුව වසර ගණනාවක් තිස්සේ විකාශනය වූ එවැනි පුළුල් පාලන රාමුවක් තිබීම හේතුවෙන් පළාත් සභාවලට පහසුවෙන් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකි බවත් කොමිෂන් සභාව විසින් පසුගිය වසරේ දී ඉදිරිපත් කළ වාර්තාවෙන් ද පෙන්වා දී තිබිණ.

02 වන යෝජනාව

ක්‍රියාකාරකම්/ ව්‍යාපෘති ද්විකරණය වීම සහ අතිවිජාදනය වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිවලට සමස්ත සම්පත් වෙන් කිරීම සහ ප්‍රමුඛත්වය ලබා දීම සම්බන්ධයෙන් මෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (5) ව්‍යවස්ථාවේ අවධාරණයෙන් සඳහන් කර ඇති අපේක්ෂිත තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේ අදහසින් වඩාත් සුදුසු ප්‍රදේශ/අංශ වෙත අරමුදල් බෙදා හැරීම සඳහා බලය සහිත ස්වාධීන ආයතනයක් පිහිටුවීමට යෝජනා කර ඇත.

03 වන යෝජනාව

මෙම වසර සඳහා සංශෝධිත අයවැයෙන් යෝජනා කර ඇති සේවක සංඛ්‍යා සමාලෝචනය කිරීම, බොහෝ කල් ගත වී ඇති බව මුදල් කොමිෂන් සභාවේ අදහසයි. පළාත් රාජ්‍ය සේවය ඇතුළු සමස්ත රාජ්‍ය සේවයම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජිත සේවක සංඛ්‍යා සමාලෝචනය කිරීමේදී, රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණි කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට සමස්ත රාජ්‍ය සේවයම ආවරණය වන පරිදි පුළුල්ව සිදු කළ යුතු බව කොමිෂන් සභාව තරයේ නිර්දේශ කර ඇත.

04 වන යෝජනාව

විදේශ ආධාර හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම සීමා කිරීමට රජය ගෙන ඇති කාලෝචිත තීරණය, මුදල් කොමිෂන් සභාව ද අගය කරයි. එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි යාන්ත්‍රණයක් පළාත් සභා සතුව තිබෙන බව ආධාර සපයන ආයතනවලට ඒත්තු ගැන්වීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මෙවැනි ව්‍යාපෘති පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් පවතින බව ආධාර ලබාදෙන ආයතනවලට ඒත්තු ගැන්වීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හැකි වන පරිදි රජය මේ සම්බන්ධයෙන් ස්ථීර ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව මුදල් කොමිෂන් සභාව යෝජනා කර ඇත.

05 වන යෝජනාව

විසර්ජන පනතින් පළාත් සභා විශේෂ වියදම් ඒකක බවට පත් කර , පළාත් ප්‍රධාන ලේකම්වරුන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස නම් කරන ලෙසට පෙර වර්ෂයේ දී මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලදී. මෙම වසරේ නිර්දේශයන්හි දී ද මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම කොමිසම නැවත අවධාරණය කර ඇත.

06 වන යෝජනාව

නව රෝහල් සහ සෞඛ්‍ය සේවා ආයතන ස්ථාපිත කිරීමේ දී ඒවා පිහිටුවනු ලබන ස්ථාන තීරණය කිරීම සහ වර්තමාන සන්දර්භයට ගැලපෙන පරිදි පවතින ආයතන පුළුල් කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති නැවත සලකා බැලීම, 06 වන යෝජනාවෙන් අවධාරණය කර ඇති අතර මෙය කාලෝචිත අවශ්‍යතාවයක් ලෙස කොමිසම නිරීක්ෂණය කර ඇත.

07 වන යෝජනාව

පළාත් සභාවලට ප්‍රතිපාදන වෙන් කිරීමේදී පළාත් ආදායම් හිලව් කිරීමේ ක්‍රියාවලිය රජය විසින් ඉදිරියේදී ද ක්‍රියාත්මක කරන්නේ නම් එම හිලව් කිරීම පුනරාවර්තන ප්‍රතිපාදනවලට වඩා ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා ගැලපීම වඩාත් සුදුසු බව කොමිෂමේ අදහසයි. විකල්පයක් ලෙස, අත්තිකාරම් “බී” ගිණුමේ ඇති විශාල පරතරය පියවා ගැනීම සඳහා පළාත් සභාවලට ඔවුන්ගේ ආදායමෙන් 40% ක් යොදා ගැනීමට අවසර දෙන ලෙස කොමිසම විසින් නිර්දේශ කර ඇත.

08 වන යෝජනාව

පළාත් සභා සහ රේඛීය අමාත්‍යාංශ අතර කාර්යයන් ද්විකරණය වීම වැළැක්විය හැකි වඩාත් ඵලදායී ක්‍රමය වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) ව්‍යවස්ථාව අනුව නිකුත් කරනු ලබන නියෝගයන්හි පළාත් සභා වෙත පවරා දෙනු ලැබූ විෂයයන් ඇතුළත් නොකිරීම බව කොමිෂන් සභාව විසින් මෙම යෝජනාවෙන් පෙන්වා දී ඇත.

09, 10 සහ 11 යෝජනා

9,10 සහ 11 යෝජනා වලින් ප්‍රාග්ධන ප්‍රතිපාදන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා අතර නිරන්තර සංවාදයක් තිබීමේ වැදගත්කම පිළිබඳව දක්වා ඇත.

12 වන යෝජනාව

පළාත් ආදායම සම්බන්ධයෙන් වන 12 වන යෝජනාව සංරචක දෙකකින් සමන්විත වේ.

- පළාත් සභාවලට පවරා දී ඇති ආදායම් මාර්ග පුළුල් කිරීම සහ එම ආදායම් ප්‍රභවයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් පනවා ඇති සීමාවන් ලිහිල් කිරීම ඉදිරි ව්‍යවස්ථා සංශෝධනවලදී සලකා බැලිය යුතු කරුණු වේ.
- වෙනස්වන තත්ත්වයන්ට අනුව විවිධ අමාත්‍යවරුන් විසින් අදාල පනත් යටතේ නිකුත් කර ඇති නියෝගවල සඳහන් ගාස්තු අනුප්‍රමාන කාලෝචිතව සංශෝධනය කළ යුතුව ඇත.

ii 2023 වර්ෂය සඳහා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

2023 වසර සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2022 ඔක්තෝබර් 25 වැනි දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 ඔක්තෝම්බර් 31 වන දින ලැබුණු අතර, ඒ අනුව 2022 නොවැම්බර් 23 වැනි දින එම නිර්දේශ පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

2.1.6 කාර්තුමය විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 සහ 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන්ට අනුව, 2022 වසරේ සෑම කාර්තුවක් සඳහාම පහත සඳහන් දිනයන්හිදී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇත.

- පළමු කාර්තුව - 2022.03. 23
- දෙවන කාර්තුව - 2022.06. 29
- තුන්වන කාර්තුව - 2022.09. 28
- හතරවන කාර්තුව - 2022.12. 30

2.2 විශේෂයෙන් සඳහන් කළයුතු කරුණු

i. 2023 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ, ගරු ජනාධිපතිතුමා සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ii මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්මට (2021-2024) අනුකූලව සකස් කරන ලද මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක ලභාකර ගැනීමට හැකි විය.

iii. **ජාතික පාසල් හරහා ක්‍රියාත්මක කරනු ලබන ජාතික පෝෂණ ආහාර වැඩසටහන සඳහා මාර්ගෝපදේශ - 2023**

ජාතික පාසල් පෝෂණ ආහාර වැඩසටහන -2023 සඳහා පළාත් සභා නවයට රු. බි. 16.6ක් අයවැයෙන් ලබා දෙන ලදී. මෙම වැඩසටහන කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ, අග්‍රාමාත්‍ය කාර්යාලයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් 2022 දෙසැම්බර් 15 වැනි දින පවත්වන ලද අතර, රැස්වීමේදී සාකච්ඡා කළ කරුණු සහ ඉදිරිපත් වූ යෝජනා මත පදනම්ව 2023 වසරේ පාසල් පෝෂණ ආහාර වැඩසටහන සඳහා සකස් කරන ලද මාර්ගෝපදේශ මාලාවක් 2022 දෙසැම්බර් 21 වන දින පළාත් සභා වෙත යවන ලදී.

iv. **නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් - 2022**

2022 වසර තුළ පළාත් සභා යටතේ වන නඩත්තු කටයුතු සඳහා ජාතික අයවැයෙන් රු.බි. 9ක් වෙන් කරන ලදි. ඒ අනුව, නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම - 2022 හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2022 අගෝස්තු 31 සිට ඔක්තෝබර් 06 දක්වා පළාත් සභා සමග රැස්වීම් මාලාවක් පවත්වන ලදී.

v. **ඇතැම් ප්‍රතිසංස්කරණ මුලපිරීම් සඳහා මුදල් කොමිෂන් සභාව සම්බන්ධ වීම.**

අ) ගරු ජනාධිපතිවරයා වෙත 2022 ඔක්තෝබර් 07 වැනි දින ඉදිරිපත් කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ අංක 2 ට සමගාමීව කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කාරක සභාව, ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා ඉහළ බලයක් සහිත ජාතික ආයතනයක් පිහිටුවීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. යෝජිත ආයතනයේ විෂය නීර්ණය සහ අදාල සංකල්ප පත්‍රිකාව කෙටුම්පත් කිරීමේ කටයුතුවලට මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා හා ලේකම්වරයා පහත දිනයන්හි පැවති වැඩමුළු සඳහා සක්‍රීයව සම්බන්ධ වූහ.

- 2022.12.14 ජනාධිපති ලේකම් කාර්යාලයේදී
- 2023/01/13 අරලියගහ මන්දිරයේදී
- 2023/02/07 පාර්ලිමේන්තුවේ කමිටු ශාලා අංක 02 හිදී

ආ) 2022 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පැවති යෝජිත ‘‘යහපාලන අධ්‍යන ආයතන’’ (School of Governance) පිළිබඳව සාකච්ඡාවට කොමිෂන් සභාවේ සභාපතිවරයා සහභාගී විය.

2.3 අභියෝග සහ අනාගත දැක්ම

පවතින මූල්‍ය අර්බුදයෙන් මිදීම සඳහා ඉදිරි වසර කිහිපය තුළ තිරසාර කඩිනම් ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අභියෝගයකට ශ්‍රී ලංකාව මේ වන විට මුහුණ දී ඇත.රට තුළ ස්ථාවර ආර්ථික හා සමාජීය සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා පවතින සීමිත සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කෙරෙන දිගුකාලීන උපාය මාර්ගික සැලැස්මක් අවශ්‍ය වේ. එබැවින්, විශේෂයෙන්ම කර්මාන්ත හා සේවා අංශවල වැඩි රැකියා අවස්ථා උත්පාදනය කරමින් ආර්ථිකය පුළුල් කිරීමට දායක වන තාර්කිකව ප්‍රමුඛතා ගත කළ සංවර්ධන වැඩසටහන් සඳහා රජයේ අරමුදල් ආයෝජනය කළ යුතුය.

මෙම සන්දර්භය තුළ, සම්පත් වෙන් කිරීමේදී පළාත්වල සමාජ හා ආර්ථික තත්ත්වයන් විශ්ලේෂණය කරමින් පළාත් මට්ටමින් ඉහළ ශක්‍යතාවයක් සහිත සංවර්ධන වැඩසටහන් හඳුනාගැනීම, මුදල් කොමිෂන් සභාව සතු වැදගත් කාර්යභාරයකි. කොමිෂන් සභාව වර්තමානයේ රට තුළ ඉහළ දරිද්‍රතාවන් නිරීක්ෂණය කරන අතර, ආර්ථිකයේ

සංකෝචනය (ලෝක බැංකුවට අනුව) හේතුවෙන් 2023 වසරේ දී දරිද්‍රතා මට්ටම 25% ට වඩා වැඩි මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආහාර උද්ධමනය, රැකියා අහිමිවීම්, සීමිත පොහොර සැපයුම සහ විදේශීය ප්‍රේෂණ පහත වැටීම හේතුවෙන් දිළිඳු කුටුම්භයන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත.

දිළිඳු පවුල්වල පාසල් ළමුන් අතර පවතින පහළ පෝෂණ මට්ටම තීරණාත්මක ගැටළුවක් වී ඇති අතර, මෙය සිසුන් පාසල්වලින් ඉවත්ව යාමේ ඉහළ ප්‍රවනතාවයකට සහ පාසලේදී ඔවුන්ගේ දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු වී ඇත (යුනිසෙෆ් ආයතනයට අනුව). මෙම තත්ත්වය නිරීක්ෂණය කළ කොමිෂන් සභාව ජාතික පාසල් පෝෂණ ආහාර වැඩසටහනට වැඩි වටිනාකමක් එක් කිරීමට දායක විය හැකි අදාල සියලු අංශ ඒකාබද්ධ කරමින් ඊට මැදිහත් වන ලෙස ප්‍රධාන ලේකම්වරුන්ට උපදෙස් දී ඇත. ඒ අනුව පළාත් සභා විසින් සෞඛ්‍ය, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර ආදී ක්ෂේත්‍රවල වාර්ෂික සැලසුම්, පාසල් පෝෂණ ආහාර වැඩසටහනට සහාය වන පරිදි සකස් කිරීමට පියවර ගෙන ඇත.

පරිච්ඡේදය - 03: 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එසිඒ-එන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කළඹ නැවත ඉලපන ලද 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		86,556,000	82,912,000	එසිඒ-3
-	තැන්පතු		56,350	111,280	එසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		3,163,586	3,147,581	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		89,775,936	86,170,861	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		89,775,936	86,170,861	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		30,763	3,087	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		89,745,172	86,167,774	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
62,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	55,244,066	50,811,429	
34,826,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	28,509,393	25,767,969	එසිඒ-2(ii)
1,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	764,634	707,312	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
97,826,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		84,518,093	77,286,710	
	මූලධන වියදම්				
250,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	199,868	460,928	
2,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,420,941	6,750,874	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
300,000	හැකියා වර්ධනය	14	206,000	29,092	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
3,050,000	මුළු මූලධන වියදම් (උ)		2,826,809	7,240,894	
	තැන්පතු ගෙවීම්		65,855	801,775	එසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		2,998,826	3,123,765	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		3,064,681	3,925,540	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		90,409,583	88,453,144	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(664,410)	(2,285,370)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		664,410	2,285,370	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එසිඒ-3

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	800,202,910	801,008,673
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	9,510,110	9,674,870
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**809,713,021**	**810,683,542**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,510,110	9,665,365
දේපළ පිරියත හා උපකරණ සංචිතය		800,202,910	801,008,673
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	9,505
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**809,713,021**	**810,683,542**

පිටු අංක 07 සිට 31 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 32 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, රීට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 20/02/2023	දිනය :	දිනය : 17/02/2023
ඒ. ටී. එම්. යූ. ඩී. බී. තෙන්නකෝන්		සන්ධ්‍යා කුමුදිනී කොතලාවල
ලේකම්		ප්‍රධාන ගණකාධිකාරි
කොමිෂන් සභාව		මුදල් කොමිෂන් සභාව
		අංක 03, සරණ මාවත, රාජගිරිය.

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය නැවත ගලපන ලද 2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	2,689,562	2,727,369
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	86,556,000	82,912,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,717,026	2,633,356
තැන්පතු ලැබීම්	56,350	111,280
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**92,018,937**	**88,384,004**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	83,893,999	76,243,756
සහනාධාර සහ මාරුකිරීම්	764,634	707,312
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,100,265	835,092
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	30,763	3,087
අත්තිකාරම් ගෙවීම්	2,638,882	2,593,510
තැන්පතු ගෙවීම්	65,855	801,775
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**89,494,398**	**81,184,532**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,524,539**	**7,199,472**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	96,270	12,330
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**96,270**	**12,330**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,620,809	7,211,802
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,620,809**	**7,211,802**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(2,524,539)**	**(7,199,472)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2021 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.02.99	පොලී ආදායම්	-	-	351,145.28	-
2003.99.00	වෙනත් ආදායම්	-	-	150,017.50	-
2004.01.00	වැන්දඹු හා අනත්දරු අරමුදල	-	-	2,284,668.79	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම(රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	97,826,000.00	97,826,000.00	84,518,093.00	86%
ප්‍රාග්ධන	3,050,000.00	3,050,000.00	2,826,809.00	93%

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(රු.)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	449,009,540.27	449,009,540.27	-	-
9152	යන්ත්‍රෝපකරණ	83,203,369.87	83,203,369.87	-	-
9153	ඉඩම්	258,000,000.00	258,000,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	9,990,000.00	9,990,000.00	-	-

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/FC/2/22/17
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2023 මැයි 11 දින.

ලේකම්,
මුදල් කොමිෂන් සභාව.

ශීර්ෂ 011 - මුදල් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 011- මුදල් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් රු.2,785,832 ක්වූ ආදායම් එකතු කර තිබුණද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය වෙනත් ආයතන විසින් කොමිෂන් සභාව වෙනුවෙන් එකතු කරන ලද ආදායමක් ලෙස දක්වා තිබුණි.

(ආ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම් ලෙස දැක්විය යුතු කොමිෂන් සභාව විසින් අනෙකුත් වැය ශීර්ෂ වෙනුවෙන් වැයකර තිබූ රු. 2,100,265 ක් සහ අනෙකුත් වැය ශීර්ෂ විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමට බැරකර තිබූ රු. 446,560 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩුකර දක්වා තිබුණි.

(ඇ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් ලෙස දැක්විය යුතු වෙනත් ආයතන විසින් කොමිෂන් සභාව වෙනුවෙන් වැයකර තිබූ රු. 65,460 ක් සහ වෙනත් ආයතන විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමට හර කර තිබූ රු. 359,944 ක් එකතු කර දක්වා තිබුණි.

(ඈ) ඉහත නිරීක්ෂණ අනුව 2022 දෙසම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය රු.664,410 ක ඍණ අගයක් වුවත් එය රු.664,410 ක ධන ශේෂයක් ලෙස නිරූපනය විය. එම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.664,410 ක්වූ ඍණ ශේෂයට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය සමාන වී නොතිබුණි.

1.6.2 **මූල්‍ය නොවන වත්කම්**

භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.800,142,912 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.800,202,910 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.60,000 කින් වැඩියෙන් දැක්විණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව,

(අ) ඒසිඒ 2(i), 2(ii), 2(iii) ආකෘතීන්හි අදාල වැය විෂයයන් පමණක් ඇතුළත් කළ යුතු බව සඳහන් කර තිබුණද පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනයේ ඒසිඒ 2(i) ආකෘතියේ කිසිදු තොරතුරක් නොතිබූ වැය විෂයයන්ද ඇතුළත් කර තිබුණි.

(ආ) ඒසිඒ 4 හි තැන්පතු ගිණුම් දැක්වීමේදී අදාළ තැන්පතු අංක පමණක් ඇතුළත් කළ යුතු වුවද කොමිෂන් සභාවට අදාළ නොවන තැන්පතු අංකද එහි ඇතුළත් කර තිබුණි.

2 **මෙහෙයුම් සමාලෝචනය**

2.1 **කාර්යසාධනය**

2.1.1 **කාර්යභාරයන් ඉටු නොකිරීම**

2018 වර්ෂයේ ආරම්භ කර තිබූ කොමිෂන් සභා පනත සකස් කිරීමේ කටයුතු 2022 වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි.

3. මානව සම්පත් කළමනාකරණය

3.1 කාර්ය මණ්ඩල පුරප්පාඩු

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 05 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පරිච්ඡේදය - 04: කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් පිළිබඳ අවශ්‍යතා තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම.	✓		
2022 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් තක්සේරු කිරීම.	✓		
2022 නිර්දේශ ගරු ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.	✓		
පළාත් සංවර්ධන සැලසුම් සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.	✓		
පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ එකඟතාව ලබා දීම.	✓		
කාර්යාලයේ මූල්‍ය හා පරිපාලනය කළමනාකරණය කිරීම.	✓		
වාර්ෂික කාර්යසාධන වාර්තාව -2021 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.	✓		

පරිච්ඡේදය - 05: තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අභිමතාර්ථ දක්වන්න

අභිමතාර්ථ/ අරමුණු	ඉලක්ක	සාක්ෂාත් කරගැනීමේ දර්ශක	මේ දක්වා සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
අදාල නොවේ					

සටහන: බලය මධ්‍යගත කිරීම හරහා රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ පළාත් සභා පිහිටුවන ලද අතර පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම හරහා මෙම කාර්යයට පහසුකම් සැලසීම මුදල් කොමිෂන් සභාව සිදු කරනු ලබයි. එමෙන්ම, පළාත් අතර අරමුදල් වෙන් කිරීම පිළිබඳ නිර්දේශ සැකසීමෙන් හා ඔවුන්ගේ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී මුදල් කොමිෂන් සභාව පළාත් සභාවලට මග පෙන්වීම සිදුකරයි.

වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශයන් සැකසීමේදී රටේ වර්තමාන සමාජ ආර්ථික සංවර්ධනයට ඉහළ වැදගත්කමක් සහිත සාධක ගණනාවක් කෙරෙහි අවධානය යොමු කර ඇත. තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව විසින් අත්සන් කර ඇති බැවින් සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDGs) සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. එබැවින්, තිරසර සංවර්ධන අරමුණුවලට සමගාමීව පළාත් සංවර්ධන සැලැසුම් සකස් කරනු ලබන අතර එම තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු ළඟා කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති සකස් කිරීමට ද මාර්ගෝපදේශ ලබාදී ඇත.

මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එක් එක් ව්‍යාපෘතිය සඳහා වන තිරසර සංවර්ධන ඉලක්ක සහ අදාල දර්ශක ආකෘති පත්‍ර III හි සඳහන් කළ යුතු අතර එමගින් වාර්ෂික සංවර්ධන සැලැස්ම තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සමග සමපාත වන බව තහවුරු කරනු ලැබේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථ සමග සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන බලය බෙදා හරින ලද සහ සමගාමී විෂයන්ට අයත් අංශ 23 ක් යටතේ පළාත් සභා වැඩසටහන ක්‍රියාත්මක කරයි. පහත සඳහන් අංශ සියලුම පළාත් සඳහා පොදු වන අතර පළාත්වල නිශ්චිත අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් වාර්ෂික වැඩසටහන පිළියෙළ කර ඇත. නිසි සාධාරණීකරණයන් සමග අදාල පළාතේ අවශ්‍යතා අනුව අවශ්‍ය වේ නම් අතිරේක අංශ ද ඇතුළත් කළ හැකිය.

* අධ්‍යාපන
* බටහිර වෛද්‍ය
* දේශීය වෛද්‍ය
* ක්‍රීඩා
* පරිවාස හා ළමාරක්ෂණ
* සමාජ සේවා
* සංස්කෘතික හා ආගමික කටයුතු
* සමූපකාර සංවර්ධනය
* පූර්ව ළමාවිය සංවර්ධනය
* පළාත් මාර්ග
* වතු යටිතල පහසුකම්
* ප්‍රවාහන
* නිවාස
* ග්‍රාමීය විදුලිබල සැපයුම
* පළාත් පාලනය
  - පළාත් පාලන මාර්ග
  - ප්‍රජා ජල සැපයුම
  - කසළ කළමනාකරණය
  - වෙනත් සේවා
* ඉඩම් සංවර්ධනය
* වාරිමාර්ග
* කෘෂිකර්මය
* පශු සම්පත්
* මිරිදිය ධීවර
* කුඩා කර්මාන්ත
* සංචාරක කටයුතු
* ග්‍රාම සංවර්ධනය

ඒ අනුව, මුදල් කොමිෂන් සභාව මගින් සෘජුව කිසිදු සංවර්ධන කටයුත්තක් ක්‍රියාත්මක නොකරයි. කෙසේ වෙතත්, එය ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන පළාත් සභා සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක සමාජ, ආර්ථික සහ පාරිසරික අංශවල පුළුල් පරාසයක් ආවරණය කරන අතර ඒවායින් බොහොමයක් පළාත් සභා විෂයයන්ට අයත් වේ. එබැවින්, ඔවුන්ගේ සංවර්ධන මැදිහත්වීම් හරහා තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් සභාවලට විශාල කාර්යභාරයක් ඇත. කෙසේ වෙතත් වර්තමානයේ රටෙහි සංවර්ධන අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සපයා ගැනීම පවා ප්‍රධාන අභියෝගයක්ව පවතින බැවින්, පළාත් ආයතනවලට ඔවුන්ගේ වාර්ෂික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් නිර්දේශිත ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබේ. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සෑම විටම තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සකසනු ලැබේ. එවැනි සැලසුම් සැකසීමේදී තිරසර සංවර්ධන ඉලක්ක සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ. අරමුදල් හිඟකම හේතුවෙන් බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමකින් තොරව අත්හැර දැමීමට සිදු වන අතර, එය අදාල තිරසර සංවර්ධන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීමට හේතු වී ඇත

කෙසේ නමුත් තිරසර සංවර්ධන අභිමතාර්ථ 16හි දක්වා ඇති පරිදි සමාජයේ සියලුම කණ්ඩායම් සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් වන පරිදි හා වෙන් කරන ලද අරමුදල් ඵලදායීව වගවීමෙන් සහ විනිවිදභාවයෙන් යුතුව භාවිතා කිරීම පිළිබඳව මුදල් කොමිෂන් සභාව සෑම විටම වග බලා ගනු ලැබේ. ඒ සඳහා පළාත් සභා නවයේ වාර්ෂික සංවර්ධන සැලසුම් අධ්‍යනය කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව ලබා දීමට පෙර වෙන් කරන ලද ප්‍රතිපාදන සාධාරණ ලෙස විවිධ අංශ අතර බෙදා වෙන් කර ඇති බවට මුදල් කොමිෂන් සභාව විසින් සහතික කරනු ලබයි.

පරිච්ඡේදය - 06: මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	17	15	02
තෘතීයික	5	3	02
ද්විතියික	46	38	08
ප්‍රාථමික	18	15	03

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මුදල් කොමිෂන් සභාවේ සමස්ත කාර්යභාරය නියමිත කාල රාමුව තුළ ඉටු කිරීම සඳහා පවතින කාර්යමණ්ඩලය විසින් අනිවාර්ය කාර්යාලීය සේවා කාලයට අමතරව කාලයක් සේවය කිරීමට සිදුව ඇත. නමුත් එක් එක් නිලධාරියාට පැවරී ඇති වැඩ ප්‍රමාණය අධික වීම නිසා ඔවුන් විසින් ඉටු කරනු ලබන සේවාවේ ගුණාත්මකභාවය අඩු වීමට හේතුවිය හැකි අතරම ඇතැම් අවස්ථාවල ක්‍රියාකාරී සැලැස්මේ පරිදි නියමිත කාල රාමුව තුළ අදාල කාර්යයන් නිම කරගැනීම ද අභියෝගයකි.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
රාජ්‍ය මුදල් රෙගුලාසි	02	දින 02	14000.00		දේශීය	රාජ්‍ය මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම
රාජ්‍ය වැටුප් ක්‍රමය	01	දින 03	15000.00		දේශීය	රාජ්‍ය අංශයේ වැටුප් කේත සකස් කිරීමේදී සහ අදාල ක්‍රියා පටිපාටිවලට අනුකූලව වැටුප් සකස් කිරීමේදී නිසි ක්‍රමවේදයන් භාවිතා කිරීම පිළිබඳ දැනුම
ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	01	දින 02	8500.00		දේශීය	රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සම්බන්ධ දැනුම
දෙමළ භාෂා ප්‍රවීනත්වය	02	පැය 100	නොමිලේ		දේශීය	දෙමළ භාෂාව පිළිබඳ ලිඛිත හා කථන දැනුම
රාජ්‍ය භාෂා ප්‍රවීනත්වය	30	පැය 150	112500.00		දේශීය	දෙමළ භාෂාව පිළිබඳ ලිඛිත හා කථන දැනුම
දෙමළ භාෂා ප්‍රවීනත්වය	01	පැය 200	15000.00		දේශීය	දෙමළ භාෂාව පිළිබඳ ලිඛිත හා කථන දැනුම
විදුලි උත්පාදක යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම	02	දින 01	20000.00		දේශීය	විදුලි උත්පාදක යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීමේ ක්‍රියාවලිය	01	දින 01	5000.00		දේශීය	රාජය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම
රාජ්‍ය සේවයේ ආකල්ප වර්ධනය කිරීම.	සියලුම කාර්ය මණ්ඩලය	පැය 05	5000.00		දේශීය	වඩා හොඳ රාජ්‍ය සේවයක් සඳහා කාර්ය මණ්ඩලයේ ආකල්ප වැඩිදියුණු කිරීම.
දියවැඩියාව වළක්වා ගන්නේ කෙසේද	සියලුම කාර්ය මණ්ඩලය	පැය 02	2000.00		දේශීය	දියවැඩියාව වැළක්වා ගැනීම පිළිබඳ දැනුම

පරිච්ඡේදය - 07: අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්	කිසිවක් නැත		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ..		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ..		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය.